# මූල්‍ය සාක්ෂරතාව



International Finance Corporation
WORLD BANK GROUP
*Creating Markets, Creating Opportunities*

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

S1-05

# මූල්‍ය සාක්ෂරතාව කියන්නේ

- ආදායම් මාර්ග හඳුනාගැනීම
- නිවැරදිව වියදම් කිරීම
- නිවැරදිව ඉතිරි කිරීම
- නිවැරදිව ණය ලබාගැනීම
- නිවැරදිව ආයෝජනය කිරීම

**ආදිය පිළිබඳව ඔබ සතු දැනුම හා කුසලතාවයි**

ඔබේත් ඔබ පවුලේත් ජීවන තත්ත්වය වඩාත් හොඳින්

පවත්වා ගැනීම සඳහා මූල්‍ය සාක්ෂරතාව ඉවහල් වේ

# සැසි අන්තර්ගතය

- මූල්‍ය සාක්ෂරතාව යනු කුමක්ද?
- ආදායම්, වියදම් හඳුනාගැනීම සහ කළමනාකරණය කිරීම.
- නිවැරදි ඉතිරිකිරීමක් තෝරාගැනීම සහ ආරක්ෂා වීම.
- ණය සහ ණය වර්ග හඳුනාගැනීම.
- ණය සඳහා ගෙවන පොලිය නිවැරදිව ගණනය කිරීම.
- මූල්‍ය ගනුදෙනුවල දී ආරක්ෂා වීම.

# ආදායම් වියදම් නිවැරදිව කළමනාකරණය කරමු



## ආදායම්

- ආදායම් මාර්ග හඳුනාගැනීම
- ආදායම් මාර්ග සක්‍රිය කිරීම
- ආදායම් ලැබෙන බවට තහවුරු කිරීම
- ලැබෙන ආදායම් නිවැරදිව ගණනය කිරීම
- විකල්ප ආදායම් මාර්ග හඳුනාගැනීම
- පසුවිපරම් කිරීම

## වියදම්

- සිදුකළ යුතු වියදම් හඳුනාගන්න
- අනිවාර්ය, අනිවාර්ය නොවන, හදිසි, හදිසි නොවන වියදම් හඳුනාගන්න
- වියදම් සිදුකරන ආකාරය සැලසුම් කරන්න
- වියදම් සිදුකරන්න
- අනවශ්‍ය වියදම් කපා හරින්න
- පසුවිපරම් කරන්න

# ආදායම් වියදම් සටහන් තබමු

| දිනය | ක්‍රියාකාරකම | ආදායම් | වියදම් | දිනය අවසානයේ මුළු ඉතිරිය |
|---|---|---|---|---|
| දිනය 1 | ආදායම් ලැබීම | | | (65,000-24,000) |
| | වැටුප් | 65,000 | | |
| | ව්‍යාපාරය | 00 | | |
| | | | | |
| | වියදම් | | | |
| | ආහාර | | 19,000 | |
| | පාසල් වෑන් රථ ගාස්තු | | 5,000 | |
| | | | | |
| | මුළු වටිනාකම | 65,000 | 24,000 | 41,000 |
| දිනය 2 | | | | (41,000-12,200) |
| | | | | |
| | | | | |
| | | | | |
| | වියදම් | | | |
| | ලීසිං වාරික | | 12,000 | |
| | දරුවන්ට රස කැවිලි | | 200 | |
| | | | | |
| | මුළු වටිනාකම | | 12,200 | 28,800 |

# නිවැරදි ආයෝජනයේ ප්‍රතිලාභ

- මූල්‍ය ඉලක්ක සපුරාගත හැක
- ඔබේ මූල්‍ය ශක්තිය වර්ධනය කරගත හැක
- ව්‍යාපාර වර්ධනය කරගත හැක
- සිහින සැබෑකරගත හැක
- මූල්‍ය ස්වාධීනත්වයක් ගොඩනගා ගත හැක
- අන් අයට පිහිටවිය හැක
- ඔබේ විශ්‍රාම දිවිය සැලසුම් කළ හැක

02

ඉතිරිකිරීම් සඳහා ආයතනයක් තෝරා ගැනීමේ දී සලකා බලනු ලබන සාධක මොනවාද ?

# අපට මුදල් ඉතිරි කළ හැකි ආයතන

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු සහ විශේෂිත බැංකු
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී බැංකු නොවන මූල්‍ය සමාගම්

- ග්‍රාමීය බැංකු
- සමූපකාර සමිති
- සමෘද්ධි/දිවිනැගුම බැංකු
- ගොවි සමිති

- බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් (ණයකරුවන්ගෙන් පමණක්)
- බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන ආයතන (ණයකරුවන්ගෙන් පමණක්)

02

ඉතිරිකිරීම් සඳහා ආයතනයක් තෝරා ගැනීමේ දී සලකා බලනු ලබන සාධක මොනවාද ?

# ඔබ තෝරාගන්නා ආයතනය

විශ්වාසය වැඩි

අවදානම අඩු

ප්‍රතිලාභ වැඩි

## ආයතනයක් විය යුතුය

ඉහළ සවල පොලී අනුපාතිකයක් සහිත, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ රජයේ වගකියනු ලබන ආයතනයන්ගේ අධීක්ෂණයට ලක්වන ආයතනයක පමණක් ඉතිරි කරන්න

ඔබ ඉතිරි කිරීමට තෝරාගනු ලබන ආයතන හා එම මුදල් සුරක්ෂිත ද?



## ඔබ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතනයන් හි ඉතිරිකිරීම් සිදුකරන්නේ නම්, එම ඉතිරිකිරීම් වඩාත් සුරක්ෂිත වේ.

## ඇයි?

මහ බැංකුව සූක්ෂම ලෙස එම ආයතන

- අධීක්ෂණය කරන නිසා
- නියාමනය කරන නිසා

ඔබ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන බැංකු සහ මුදල් සමාගම් සමගින් ඉතුරුම් පවත්වාගෙන යන්නේ නම්, එම ඉතුරුම් මුදලින්

**රු. මිලියන 1.1 උපරිමයක් සඳහා තැන්පතු රක්ෂණාවරණයක් හිමි වේ.**




# ඔබ ඉතිරි කරන්න තැනක් හොයනවද?

# හොඳට හිතන්න

ආයතනයේ ස්ථාවරත්වය


වාර්ෂික සඵල පොලී අනුපාතිකය

ස්ථාවර තැන්පතු සඳහා කාලසීමාව

කල්පිරීමට පෙර ආයෝජිත මුදල් ලබාගන්නේ නම්,

සුන්දර වදන්

## ATM එකෙන් සල්ලි ගද්දි සල්ලි කැපෙනවා    බැංකුවෙන් ගන්න එක වාසි



# ATM කාඩ්පත භාවිතය මගින්

- දවසේ අවශ්‍ය ඕනෑම වෙලාවක මුදල් ලබාගැනීමේ හැකියාව
- පෝලිම් වල රස්තියාදු වන කාලය ඉතිරි කරගත හැකිවීම
- ඕනෑම තැනක සිට ගනුදෙනු කිරීමේ හැකියාව (ලංකාව තුළ හා ඉන් පිටත)
- ඉතිරිකිරීම් ශේෂය පහසුවෙන් දැනගත හැකිවීම
- පෝරම පිරවීමේ අපහසුතාවෙන් ඔබ මුදවයි
- පහසුවෙන් එහා මෙහා ගෙනයා හැකි නිසා ආරක්ෂාව උපරිමයි
- හදිස්සියක දී වෙනත් බැංකුවක යන්ත්‍රයකින් වුවද මුදල් ලබාගත හැක.

  ඒ සඳහා වැයවන මුදල ඔබේ බැංකුව වෙත යන ගමන් ගාස්තුවටත් වඩා අඩු මුදලකි.

# ATM කාඩ්පත් භාවිතයේ දී

- රහස් අංකය අන් සතු නොවීමට වගබලා ගත යුතුයි
- ATM කාඩ්පත හා රහස් අංකය කිසිවිටෙක දී එකම ස්ථානයක රැඳවා නොගත යුතුයි
- ATM කාඩ්පත අස්ථානගත වුවහොත් ඉක්මනින්ම බැංකුව දැනුවත් කිරීම සිදුකළ යුතුයි
- SMS පණිවුඩ ක්‍රමය සක්‍රීය කරගෙන ආරක්ෂාව තහවුරු කරගත යුතුයි

# තීරණය ඔබ අතේ

කියන්නා කෙසේ කීවත් අසන්නා සිහිබුද්ධියෙන් ඇසිය යුතුයි.

## ලියලම බලන්න

- ආකර්ෂණීය වචන පිටුපස ඇති කොන්දේසි මොනවාද?
- අදාළ වාසි ඇත්තටම ගන්නේ කොහොමද?



# ණය

# ඔබගේ අවශ්‍යතාව අනුව ඔබට ලබාගත හැකි මූල්‍ය ණය පහසුකම්



අධ්‍යාපන ණය

ව්‍යාපාර ණය

වගා ණය

හදිසි ණය

නිවාස ණය

වාහන ණය

උකස් ණය

පුද්ගල ණය

# ණය මුදලක් සඳහා ඇප අත්සන් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- ණයකරුගේ ණය ගෙවීමේ හැකියාව
- ණයකරු සමග ඇති සබඳතාව

**අවධානයට**

ඇපකරුටද ණයකරුට හා සමාන වගකීමක් ණය මුදල අවසන් වන තෙක් පවතී

නිවාස ණයවලට වඩා පුද්ගල ණය මුදලක පොලී අනුපාතිකය ඉහළයි

නිවාස ණයවලට වඩා අඩු කාලයක් ණය ගෙවීම සඳහා හිමි වේ

නිවාස අලුත්වැඩියාවට අවශ්‍ය මුදලට වඩා අඩු මුදලක් පුද්ගල ණය මුදලක් ගැනීමේ දී හිමිවීමට ඉඩ ඇත

පුද්ගල ණය සඳහා ශක්තිමත් ඇපකරුවන් සෙවීමට සිදුවීම

# පොලී අනුපාතික

## සමතල පොලී අනුපාතිකය

ණය මුදලේ ආරම්භක ණය ශේෂය මත ණය කාලය පුරාම පොලිය සකස් කිරීම

## හීනවන ශේෂ පොලී අනුපාතිකය

ණය මුදලක පවතින ශේෂය අනුව පොලිය සකස් කිරීම

සමතල පොලි අනුපාතයේ දෙගුණය - 2

=

හීනවන ශේෂ පොලි අනුපාතය

(ආසන්න වශයෙන්)

# සඵල පොලිය ගණනය කිරීම

සඵල පොලී අනුපාතිකය = (ලබාගත් ණය මුදල පියවීම සඳහා වියදම් කළ මුළු මුදල (පොලිය, අනෙකුත් ගාස්තු) / පිටත ණය ශේෂයේ සාමාන්‍ය) X 100

පිටත ණය ශේෂයේ සාමාන්‍ය = එක් එක් ණය වාරික තුළ ඇති මූලික ණය මුදල් වල එකතුව / වාරික ගණන

# පොලී අනුපාතය

## නාමික පොලී අනුපාතිකය

ණය මුදලක් වෙනුවෙන් ඔබ ගෙවිය යුතු යැයි සඳහන් පොලී අනුපාතිකයයි

## සඵල පොලී අනුපාතිකය

ණය මුදලක් වෙනුවෙන් ඔබ ඇත්තටම ගෙවන පොලී අනුපාතිකයයි

# පනින්න පෙර සිතා බලමු

## පේන දේට වඩා දකින දේ වෙනස්

- පේන පොලිය ම ද ගෙවන්න තියෙන්නේ?
- ඇත්තටම ගෙවන ගාණ?
- සැඟවුණු ගාස්තු මොනවාද?
- ඇත්තටම ගෙවන ගාණට එහි බලපෑම?
- ආයතනයේ කොන්දේසි ඇත්තටම ගෙවන ගාණට කරන බලපෑම?
- පොලී ගණනය කරන්නේ කොහොමද ?

# අතමාරුව හිත අමාරුවක් නොවෙන්න

## ගන්න

- ✓ ආයෝජනය සඳහා පමණක්
- ✓ අවශ්‍ය ණය මුදල අවශ්‍ය අවස්ථාවේදී
- ✓ දැරිය හැකි පොලී අනුපාතයකට
- ✓ විධිමත් මූල්‍ය ආයතනයකින් පමණක්

## එපා

- ✗ පරිභෝජනයට ණය ගන්න
- ✗ ණය නොගෙවා ඉන්න
- ✗ ණය අවභාවිත කරන්න
- ✗ බලෙන් ලබාදෙන ණය ගන්න

# CRIB ඔබ ගැන දැනුවත්

# CRIB ගැන ඔබ දැනුවත්ද?

# ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය CRIB

CRIB සමග සම්බන්ධ වී ඇති ණය දෙන ආයතන මගින් ලබාගත් ණය පිළිබඳ තොරතුරු එක්රැස් කොට පවත්වාගෙන යනු ලබයි.

එම ණය තොරතුරු ඔබගේ හෝ ණය දෙන ආයතනවල ඉල්ලීම මත ණය තොරතුරු වාර්තාවක් ලෙස නිකුත් කරනු ලබයි.

## ඔබේ නමත් CRIB එකේ තියෙනවද?

ඔබ බැංකුවකින් හෝ මූල්‍ය ආයතන වලින්

- ණය ලබාගෙන ඇත්නම්
- ණය සඳහා ඇප අත්සන් කර ඇත්නම්

ඔබත් එහි ඉන්නවා.

ඔබේ නම CRIB සතුව පැවතීම අලුතින් ණය පහසුකමක් සඳහා ඉල්ලුම් කිරීමේ දී පහසුවක් වේ.

නැවත ණය ලබාගැනීමට එය බාධාවක් කර නොගන්න

ඔබගේ ණය තොරතුරු මත පදනම්ව ණය මාපකයක් (Credit Score) නිකුත් කෙරෙනවා.

නියමිත දිනයට ම ගෙවනවා නම් -

උපරිම - ලකුණු 900

කල්පසුවී ගෙවන කාලය අනුව -

අවම - ලකුණු 250

ලකුණු රැස්කරමු. ණය ඉතිම ගොඩනගමු

නිසි පරිදි ණය ආපසු ගෙවා ප්‍රශස්ත ණය ලකුණක් පවත්වාගෙන යා හැකියි

## ඔබේ ණය තොරතුරු වාර්තාව
## ඔබ ගැන ඔබේ බැංකුවට කිව හැකි හොඳම ක්‍රමයයි

# ATM කාඩ්පත භාවිතය මගින්

- දවසේ අවශ්‍ය ඕනෑම වෙලාවක මුදල් ලබාගැනීමේ හැකියාව
- පෝලිම් වල රස්තියාදු වන කාලය ඉතිරි කරගත හැකිවීම
- ඕනෑම තැනක සිට ගනුදෙනු කිරීමේ හැකියාව (ලංකාව තුළ හා ඉන් පිටත)
- ඉතිරිකිරීම් ශේෂය පහසුවෙන් දැනගත හැකිවීම
- පෝරම පිරවීමේ අපහසුතාවෙන් ඔබ මුදවයි
- පහසුවෙන් එහා මෙහා ගෙනයා හැකි නිසා ආරක්ෂාව උපරිමයි
- හදිස්සියක දී වෙනත් බැංකුවක යන්ත්‍රයකින් වුවද මුදල් ලබාගත හැක. ඒ සඳහා වැයවන මුදල ඔබේ බැංකුව වෙත යන ගමන් ගාස්තුවටත් වඩා අඩු මුදලකි.



# ඇයි SMS?

- ඔබේ වටිනා කාලය ඉතිරි කරයි
- ඔබේ ගිණුමෙහි සිදුවන ඕනෑම ගනුදෙනුවක තොරතුරු එවෙලෙහිම දැනගැනීමට හැකියාව
- ඔබ ගෙවිය යුතු ණය වාරික පිළිබඳව දැනුවත් කිරීම
- ඔබට ලබාගත හැකි මූල්‍ය පහසුකම් පිළිබඳව නිතර දැනුවත් කිරීම



Cash withdraw Acc no ******89 location: Ragama Railway ATM.LKA 19500.00. AV Bal LKR 10031.98. Date ;28.11.2019. time 17.56 hot line 0712345678

සල්ලි ගත්තොත්

A Transaction for LKR 15000.00 has been credited to Acc no ******89 on 20/11/2019 14: 37. AV Bal LKR 27565.98. Date hot line 0712345678

සල්ලි දැම්මොත්

Purchase Debit account no ******89 location: Ragama Cargills .LKR 1955.00. AV Bal LKR 12565.98. Date; 26.11.2019. Time 17.56 hot line 0712345678

බඩු ගත්තොත්

# අත්සන් කරද්දී හොයලා බලන්න ඕනෙමද?

ගොඩින් කීයද? මඩින් කීයද?
මාමණ්ඩි කිව්ව ගාණම දාලද?

දැනගත්ත නම් අත්සන් කරන්න තිබුණා බය නැතිවම

මොනවද බලන්නේ

- භාෂාව තේරෙනවද?
- ආයතනයේ කොන්දේසි මොනවාද?
- කොන්දේසි කඩකළහොත් සිදුවන අවාසි මොනවාද?

අත්සන් කලාට පස්සේ වෙනස් කරන්න බෑ.
ගලේ කෙටුවා වගේ

# ඔබගේ ඉතුරුම් සම්බන්ධයෙන් ගැටළුවක් ඇත්නම්




කළමනාකරු හමුවන්න → ගැටළුවට විසඳුමක් නැත → පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව මහ බැංකුව

කළමනාකරු හමුවන්න → ගැටළුවට විසඳුම

# ඔබගේ ණය සම්බන්ධයෙන් ගැටළුවක් ඇත්නම්




කළමනාකරු හමුවන්න

ගැටළුවට විසඳුම

ගැටළුවට විසඳුමක් නැත

ණය සහන මණ්ඩලය

ගැටළුවට විසඳුම

පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව මහ බැංකුව

මූල්‍ය ඔම්බුඩ්ස්මන්

# මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව

# Financial Consumer Relations Department


- 94 11 247 7966

- 94 11 247 7744

- අංක 30,
  ජනාධිපති මාවත, කොළඹ 01

- fcrd@cbsl.lk